**ශීර්ෂය 102 - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 102 - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා අග්‍රිම ඉල්ලීම් සැලසුම අනුව ඉල්ලුම් කල යුතු අග්‍රිම එකතුව රු.මිලියන 3,549 ක් වුවද, රු.මිලියන 74,081 ක් ඉල්ලුම් කර රු.මිලියන 54,374 ක අග්‍රිමයක් ලබාගෙන තිබුණි. | 2023 වර්ෂය සඳහා සැලසුම් කළ ඇස්තමේන්තු වලට අමතරව රටෙහි පැවැති ආර්ථික තත්ත්වයන් හේතුවෙන් රජය විසින් වරින් වර ගනු ලැබූ විවිධ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමට අදාලව සමාජ සුභ සාධන වැඩසටහන් සහ විවිධ ව්‍යාපෘති සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දීම හේතුවෙන් සැලසුම් කළ අග්‍රිම ප්‍රමාණයට වඩා අග්‍රිම ලබා ගැනීමට සිදුව ඇත. | විධිමත් පරිදි සංශෝධනය කර නිවැරදිව සැලසුම් කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

#### 2.2.1 ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 07 ක් සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු. 7,500,000 ක් වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම උපයෝජනයෙන් තොරව ඉතිරි කර තිබුණි. | අපේක්ෂිත පරිදි වියදම් ඉදිරිපත් නොවීම | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව හා තාත්ත්විකව කළ යුතු වීම. |
| (ආ) | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට වැය විෂයයන් 09 ක් සඳහා 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු.506,400,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.392,195,891 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි කර තිබුණි. එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 56 සිට සියයට 92 ක පරාසයක් ගෙන තිබුණි. | නිලධාරීන් ස්ථාන මාරු වීම හා අයවැය චක්‍රලේඛ 01/2023 හා 02/2023 ප්‍රකාරව අතිකාල වියදම් සීමා කිරීම හා පාලනය කිරීම, ප්‍රසම්පාදන කටයුතු අපේක්ෂිත පරිදි සිදු නොවීම, ගොඩනැගිලි කුලී සඳහා ප්‍රතිපාදන වැයවීමක් සිදු නොවීම, ණය ශේෂ කපා හැරීම සඳහා අනුමැතිය ලබා දීම ප්‍රමාද වීම, මූලධන ස්වරූපයේ නඩත්තු අවශ්‍යතා ඇති නොවීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වීමට හේතු වීම. | ප්‍රතිපාදන උපරිම අයුරින් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.75,000,000 ක් වූ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් සහිත “වෙනත්” පුනරාවර්තන වැය විෂයය සඳහා අවස්ථා හතරකදී එකතුව රු.376,800,000 ක් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන හා මු.රෙ. 66 මඟින් අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දිනට වැය විෂයයේ රු.356,302,119 ක් ඉතිරි වී තිබුණි. | • අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ඇස්තමේන්තු නොකළ වියදම් දැරීම හා භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ යාම හේතුවෙන් පරිපූරක ඇස්තමේන්තු මඟින් හා මු.රෙ.66 යටතේ අමතර ප්‍රතිපාදන සලසා ගැනීම.<br>• ගරු ජනාධිපතිතුමා සමඟ 2023.02.16 දිනැතිව සිදු කරන ලද සාකච්ඡාව අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මූල්‍ය උපකාරක වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව ප්‍රචාරණ කටයුතු ක්‍රියාත්මක කිරීම නවතා දැමීම හා විශේෂිත කාර්යයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සාමාන්‍ය වියදම් සඳහා යොදවා නොගැනීම ප්‍රතිපාදන ඉතිරිවීම සඳහා හේතු වීම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව හා තාත්ත්විකව කළ යුතු වීම. |
| (ඇ) | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ අයවැයගත මුළු වියදම් ඇස්තමේන්තුව රු.3,502,435,000 ක් වූ අතර, මෙම ඇස්තමේන්තු මුදල් ප්‍රමාණවත් නොවීම මත පරිපූරක ප්‍රතිපාදන යටතේ එකතුව රු.55,921,882,687 ක් අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ අයවැයගත මුළු වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදන හා සැලකීමේදී පරිපූරක ප්‍රතිපාදන යටතේ අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමේ විචලනය සියයට 1497 ක් වී තිබුණි. | 2023 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස්කිරීමේ දී රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිතායතනය සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පිළිබඳව ඉල්ලීම් ඉදිරිපත්ව නොතිබූ බැවින් ඒ සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා ගෙන තිබීම ත් සුභ සාධක ප්‍රතිලාභ මණ්ඩලය යටතේ 102-01-02-13-1501 වැය විෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සම්බන්ධයෙන් ද ඉල්ලීම් ඉදිරිපත් නොවූ අතර 2023 වර්ෂය තුළදී අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු වීම. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2023 වර්ෂයේදි පරිපූරක ප්‍රතිපාදන යටතේ සලසා ගත් ඉහත රු.55,921,882,687 න් මූලික අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණු වැය විෂයන් 19 ක් සඳහා රු.55,486,847,400 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු.52,406,189,937 ක් වැය කර තිබූ අතර, එකතුව රු.3,067,135,497 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය තුළ වැය විෂයයන් 03 ක එකතුව වූ රු.20,500,000 ක් කිසිඳු උපයෝජනයක් කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | • සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් කොටසක් ගිණුම් විවෘත කිරීම ප්‍රමාදවීම, IWMS දත්ත පද්ධතියට අදාළව වවුචර්පත් ඉදිරිපත් නොවීම.<br><br>• රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිත ආයතනයේ හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයේ අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් පත් නොකිරීම, මෙම ඒකක රජයේ කාර්යාලයක පැවතීම, අයවැය චක්‍රලේඛ 01/2023 හා 02/2023 ප්‍රකාරව වියදම් සීමා කිරීම, ඉන්ධන දිමනා හිමි නිලධාරීන් පත් නොකිරීම, NAPPP සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ දායකත්වය ලැබීම, මූලධන ස්වරූපයේ නඩත්තු අවශයතා ඇති නොවීම නිසා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොවීම. | -එම- |

**2.2.2 අමාත්‍යාංශයේ ඒකක හා වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති ප්‍රතිපාදන**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී රාජ්‍ය ආයතන හා අමාත්‍යාංශයේ ඒකක 5 ක් වෙත ප්‍රාග්ධන වැය විෂයයන් 9 ක් සඳහා මාරු කර දී තිබූ එකතුව රු.277,574,700 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.260,964,398 ක් හෙවත් සියයට 42 – 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මිලදි ගැනිම් සිදු කිරීම ප්‍රමාද වීම, ඊ රාජ්‍ය ප්‍රසම්පාදන ව්‍යාපෘතියේ ප්‍රතිශෝධිත ගිවිසුම සමග ගිවිසුම්ගත වීම ප්‍රමාද වීම සහ ලෝක බැංකු ආධාර වලින් වියදම් දැරීම, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිත ආයතනයේ කාර්යාලය වෙනත් රජයේ ගොඩනැගිල්ලක පැවතීම නිසා නඩත්තු වියදම් අවම වීම, මූලධන ස්වරූපයේ නඩත්තු අවශ්‍යතා ඇති නොවීම, ආසියානු සංවර්ධන බැංකුවේ දායකත්වය | ප්‍රතිපාදන, උපරිම අයුරින් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

ලැබීම හා කාර්යාලීය වියදම් අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් දැරීම, රජයට අයත් ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයේ බොහෝ නඩත්තු කටයුතු අගමැති කාර්යාලය විසින් සිදු කිරීම, බදු අභියාචනා කොමිෂන් සභාවේ මූලධන ස්වරූපයේ නඩත්තු අවශ්‍යතා ඇති නොවීම හේතුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොවීම.

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් වසර 10 – 20 දක්වා කාලයක් ඉක්මවූ අයවිය යුතු ණය ශේෂ එකතුව රු.469,418 ක් සහ වසර 1 – 3 දක්වා කාලය ඉක්මවූ අයවිය යුතු රු.119,073 ක ණය ශේෂය වශයෙන් එකතුව රු.588,491 ක හිඟ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය වෙත අයවී නොතිබුණි. | සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් 2024 ජනවාරි මාසය සඳහා රු.5000.00ක මුදලක් අය වී ඇති අතර ඉතිරි වාරික අයකර ගැනීම සඳහා සිහිකැඳවීම් ලිපි යොමුකර ඇති බව හා තවදුරටත් ණයහිමියා විසින් ගෙවීම සිදු නොකරන්නේ නම් එම මුදල ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කරන බවත්, තවත් එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය පිළිබඳව නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇත. | හිඟ ණය අයකර ගැනිමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අනුයුක්තව සිටි නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු.2,633,505 ක් විය. මෙම ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය වෙත අයවී නොතිබුණි. | එවකට පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය අහෝසි වූ අතර එහි පාලන කටයුතු මුදල් අමාත්‍යාංශයට පැවරුණි. එහෙයින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුමේ ශේෂය මුදල් අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුම් අංක 10201 වෙත පවරා ගන්නා ලදි. ඉදිරියේදී එම ණය ශේෂ අයවිය යුතු පුද්ගලයින් සේවය කරන සේවා ස්ථාන තවදුරටත් හඳුනා ගෙන අයකර ගැනීමට හෝ එසේ අයකර ගත නොහැකි ණය ශේෂයන් මු.රෙ. 113 (3) | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රකාරව ණය ශේෂ කපා හැරීමට හෝ කටයුතු කරන බව දැනුම් දෙමි. | |
| (ඇ) | විශ්‍රාම ගොස් ඇති නිලධාරින් 03 දෙනෙකුගෙන් වසර 20 ඉක්මවූ රු.150,623 ක් ද, වසර 5-10 අතර රු.99,425 ක් ද වශයෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිඟ ණය ශේෂය රු.250,048 ක් බව නිරීක්ෂණය විය. | විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගෙන් අය විය යුතුව තිබූ වසර 1ට අඩු රු.66,270 ක ණය ශේෂය නිරවුල් කරන ලදි. අනෙකුත් නිලධාරීන්ගේ ණය ශේෂ පිළිබඳව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති අතර ඒ අනුව, ඉදිරි කටයුතු කරන බව තවදුරටත් දන්වා සිටිමි. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ දේශීය හා විදේශීය අරමුදල් උපයෝජනයෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 2 ක් සම්බන්ධයෙන් වූ වැය විෂයයන් 03 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.631,500,000 කින් රු.513,600,350 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 සිට 84 ක් වූ ප්‍රමාණයක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි කර තිබුණි. | මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම, අන්තර් භාණ්ඩාගාර තොරතුරු පද්ධති ව්‍යාපෘතියේ දේශීය අරමුදල් යොදාගෙන පුහුණු වැඩසටහන් වර්ෂය පුරාවට සිදුකිරීමට නොහැකි වීම හා ITMIS පද්ධතියේ කටයුතු වසරේ මුල් භාගයේදී අත්හිටුවීමට සිදුවීම නිසා අපේක්ෂිත වියදම් දැරීමට සිදු නොවීම. | ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |

#### 3.1.2 රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණය

රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණය ඒකකයක් පිහිටුවා තිබුණ අතර ඒ පිළිබඳව පහත නිරීක්ෂණ කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ඔක්තෝබර් 25 දිනැති අංක MF/063/CM/2022/215 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව 37දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් මෙම ඒකකයට | මේ යටතේ පෙන්වා දී තිබූ පරිදි 2022 ඔක්තෝබර් මස 11 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ MF/052/CM/2022/215 රාජ්‍ය ව්‍යවසායකත්ව | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසා අවශ්‍යතාවය, කුසලතාවය හා |

| | | | |
|---|---|---|---|
| | අනුමත වී තිබුණ අතර, 2023 සැප්තැම්බර් 25 දිනැති අංක MF/052/CM/2022/177 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරවා ගැනීමකින් තොරව ඒකකය සඳහා කොන්ත්‍රාත් පදනම මත 12 දෙනෙකු බඳවාගෙන තිබුණි. | ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය සඳහා 37 කින් සමන්විත කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මෙම ඒකකය සඳහා තාවකාලිකව බඳවා ගත් තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කරන ලදි. විශේෂයෙන්ම මෙම ඒකකයේ ප්‍රධානතම පරමාර්ථය වූයේ රජයට අයත් සියලුම ව්‍යාපාරික ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීමට ප්‍රතිපත්තියක් සකස් කර, ඊට අවශ්‍ය ස්ථාපිත ආයතනයක් පිහිටුවීමයි. ඒ අනුව, එම පිහිටුවන ලබන ආයතන පාලක සමාගම (Holding Company) යටතේ බඳවා ගන්නා කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමට කටයුතු කරනු ඇත. | නිපුණතා මත පදනම්ව බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතු වීම. |
| (ආ) | රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ සඳහන් 02 වන මූලධර්මයෙහි සඳහන් පරිදි පාලක සමාගමක් පිහිටුවීම හා 2023 මැයි මස 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් අංක MF/036/CM/2023/107 හා 2023.05.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4.2 හා 4.3 ඡේද අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇතුළත් රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ ඇමුණුම 02 හා 03 හි ලැයිස්තුගත කර ඇති ආයතන 72 ක් ප්‍රතිව්‍යුහගතකරණය සඳහා පාලක සමාගම (HOCO) වෙත, එහි අනුබද්ධිත සමාගම් ලෙස පැවරීමට දක්වා තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි පාලක සමාගමක් (HOCO) ස්ථාපිත කර නොතිබුණි. | පාලක සමාගමක් පිහිටුවීම සඳහා යෝජනා කර, එහි කෙටුම්පත් සකස් කර මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදි. පසුව එම කාර්යය යෝජිත රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ පනතට ඇතුලත් කර එය ආරම්භ කිරීම සුදුසු බව රජයේ ප්‍රතිපත්තිය විය. එම නිසා ඉහත යෝජනා මේ වන විටත් ක්‍රියාත්මක වී නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | ඉහත පරිදි පාලක සමාගම (HOCO) වෙත පවරාගෙන, ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා වී තිබූ ඉහත සංදේශයේ ඇතුළත් රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ ඇමුණුම 02 ලැයිස්තුවේ සඳහන්, ආයතන 08 ක් අතරින් ආයතන 07 ක් මේ වන විටත්, පාලක සමාගම වෙත පවරා ගැනීමකින් තොරව, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ රජය සතු කොටස් බැහැර කිරීමට (Divesture) ගනුදෙනු උපදේශකවරුන් බඳවාගෙන ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ අදියර කිහිපයක් ක්‍රියාත්මක කර ඇති බවත්, මේ යටතේ ඇති එක් ආයතනයක් නීතිපතිවරයාගේ උපදෙස් මත තාවකාලිකව අත්හිටුවා ඇති බවත් නිරීක්ෂණය විය. | මේ යටතේ දක්වා ඇති ආයතන 08 අතරින් ආයතන 07 ක් මේ වන විටත් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ, රජය සතු කොටස් බැහැර කිරීමට (Divestiture) ගනුදෙනු උපදේශකවරුන් බඳවා ගෙන ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ අදියර කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා රජයේ ප්‍රමුඛතාව අනුව 2023.03.13 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී, අංක 23/0431/604/046 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු, මෙම කාර්යයන් ආරම්භ කර ඇත. මේ යටතේ Water Edge ආයතනය නීතිපතිවරයාගේ උපදෙස් මත තාවකාලිකව අත්හිටුවා ඇත. | -එම- |

### 3.1.3 රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිතායතනය

රාජ්‍ය සේවා කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස රාජ්‍ය ආයතන හා පෞද්ගලික අංශයේ සහයෝගීතාවයෙන් යුත් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදයක් හඳුන්වා දීම අරමුණු කර ගනිමින් 2022 සැප්තැම්බර් මස 13 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතිය මත රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිතායතනය පිහිටුවා තිබුණ අතර ඒ පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසා අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදුකල යුතු වුවද, 2024 මැයි 06 දින වන විට කාර්යමණ්ඩලය සඳහා 11 දෙනෙකු වසර 03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා බඳවාගෙන තිබුණ ද, බඳවා ගැනීම් පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2023.09.22 දින අප විසින් කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා සම්බන්ධයෙන් (Scheme of Recruitment) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කරන ලදි. එම කරුණ සම්බන්ධව මෙතෙක් පිළිතුරක් ලැබී නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වීම. |

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව, 2023 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව නියෝජිතායතනය ව්‍යාපෘති 12 සම්බන්ධයෙන් කටයුතු ආරම්භ කර ඇති අතර තවදුරටත් ව්‍යාපෘති 07 ක් සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිශ්චිත නෛතික රාමුවක් පැවතීම ඉතා වැදගත් වුවද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහනේ නෛතික රාමුව (PPP bill) කෙටුම්පත් මට්ටමේ මූලික අදියරයන්හි පැවතුණ බව නිරීක්ෂණය විය. | 2023 දෙසම්බර් 31 වන දින විට පෞද්ගලික හවුල්කාරිත්වය වැඩසටහනේ නෛතික රාමුව (PPP Bill) මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද පෞද්ගලික හවුල්කාරිත්වය වැඩසටහනේ නෛතික රාමුව අනුමත වන තෙක් PPP ව්‍යාපෘති සඳහා "Guidelines on Government Tender Procedure - Part II" සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක "02/ 2019"උපයෝගී කරගනු ලබයි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ඊට අදාළ නෛතික ප්‍රතිපාදන සලසා ගත යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම** | | |
| | අමාත්‍යාංශයේ 2022 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව Digital Printing ක්‍රමවේදය යටතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් එකක් පිළිවෙලින් රු.30,894 ක්, රු.38,605 ක් හා රු.28,641 ක් බැගින් රු.4,285,237ක් වැයකර පිටපත් 120 ක් මුද්‍රණය කරවා ගෙන තිබුණ අතර යලි ඇනවුම් කිරීම යටතේ Offset Printing ක්‍රමවේදය යොදාගෙන එම සැපයුම්කරුගෙන්ම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් එකක් පිළිවෙලින් රු.3,768 ක්, රු.3,415 ක් හා රු.4,694 ක් බැගින් රු.8,223,190ක් ගෙවා වාර්තා පිටපත් 1,600 ක් මුද්‍රණය කරවාගෙන තිබුණි. නැවත ඇණවුම් කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 (ඇ) වගන්තියට පටහැනිව සිදු කර ඇති බවත්, Digital Printing යටතේ මුද්‍රණය කළ වාර්තා පිටපත් 120 Offset Printing ක්‍රමවේදය යොදාගෙන මුද්‍රණය කරවා නොගැනීම හේතුවෙන් රු.3,185,633ක අමතර පිරිවැයක් දරා ඇති බවත් නිරීක්ෂණය විය. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මඟින් දන්වා තිබූ පරිදි වාර්ෂික වාර්තා පිටපත් 120 මුද්‍රණය කිරීම සඳහා වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ආයතන 12 වෙතින් මිල ගණන් කැඳවන ලදී. මෙහි දී වාර්ෂික වාර්තා 120 පමණ කුඩා ප්‍රමාණයක් මුද්‍රණය කිරීමට නියමිත බැවින් Offset Printing ක්‍රමයට මුද්‍රණය කිරීමේ දී ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු විය හැකි බව සලකා වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීමේ දී Digital Printing Method භාවිතයෙන් පමණක් මිල ගණන් කැඳවීම.<br><br>අ.පො.ස උසස්පෙළ හදාරන සියලුම පාසල් ආවරණය වන පරිදි බෙදා දීමට අති ගරු | ප්‍රසම්පාදනයේදී රජයට වඩාත් වාසිදායක ක්‍රමවේදය තෝරා ගැනීමට කටයුතු කළ යුතු වීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 (ඇ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

ජනාධිපති තුමා උපදෙස් ලබා දී, ඒ අනුව දෙවන මුද්‍රණයේ පිටපත් 1,600ක් මුද්‍රණය කිරීම සඳහා Offset Printing ක්‍රමවේදය අනුගමනය කිරීම සුදුසු බව අමාත්‍යාංශයේ මහා පරිමාණ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය විය. තවද, ප්‍රථම වාර්ෂික වර්තා 120 මුද්‍රණය කිරීමේ දී පාසල් සඳහා බෙදා දීමට නියමිත වූ පොත් 1,600 පිළිබඳව දැනුවත්ව නොසිටි අතර පොත් කුඩා ප්‍රමාණයක් මුද්‍රණය කිරීම සඳහා වඩාත් වාසි දායක ක්‍රමය වන Digital Printing ක්‍රමවේදය අනුගමනය කරන ලදී.

**(ආ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය සඳහා විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පද්ධතියක් සැකසීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) විවෘත තරඟකාරී ලංසු කැඳවා විසඳුම් සපයන්නෙකු (Solution Provider) තෝරා ගැනීමට කටයුතු කිරීමෙන් තොරව 2007 උපදේශකවරුන් තෝරාගැනීම හා සේවය ලබාගැනීම සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.13 වගන්තිය ප්‍රකාරව තනි ප්‍රභවයක් තෝරාගැනීමේ (Single Source Selection – SSS) පදනමට කොළඹ විශ්ව විද්‍යාලයට සම්බන්ධිත ආයතනයක් ලෙස හඳුන්වමින් පුද්ගලික සමාගමක් වෙත e-GP පද්ධතිය සැකසීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමටත්, ඒ සඳහා මූලික ගිවිසුමකට එළඹීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් 2019 ජූනි 18 දින අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද, 2019 ඔක්තෝබර් 11 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ සංදේශය අනුව උක්ත කොන්ත්‍රාත්කාර සමාගම, කොළඹ විශ්ව විද්‍යාලය (UCSC) යටතේ ක්‍රියාත්මක නොවන බවටත්, ස්වාධීන සමාගමක් බව කොළඹ විශ්ව

තීක්ෂණ ආයතනය සමඟ මූලික ගිවිසුම අත්සන් කිරීමේදී ඉදිරිපත් කර තිබූ ලියවිලි අනුව කොළඹ විශ්ව විද්‍යාලයට අයත් බව නිරීක්ෂණය වී ඇති අතර පසුව කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිනිය දන්වා එවා ඇති පරිදි එම ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ නොමැති බවට තහවුරු වීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර ඇත.

ප්‍රසම්පාදනයේදී රජයට වඩාත් වාසිදායක ලෙස හා ඵලදායී වන අයුරින් නිවැරදි සැපයුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු වීම.

| | | | |
|---|---|---|---|
| | විද්‍යාලයේ උපකුලපතිතුමිය විසින් 2019 ජුනි 17 දිනැති ලිපිය මඟින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා තිබුණි. | | |
| (ii) | e-GP පද්ධතිය සැකසීමේ මූලික කොන්ත්‍රාත්තුව රු.71,500,000 කට පිරිනමා කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම්ගත වීම 2019 නොවැම්බර් 25 දින සිදු කර තිබුණ ද 2021 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්කරු ප්‍රමාණවත් කාර්යසාධනයක් පෙන්වා නොතිබුණි. එසේ තිබිය දීත් e-GP පද්ධතියේ මෘදුකාංග සංවර්ධන ක්‍රියාවලිය නිර්දේශිත වැඩි දියුණු කිරීම් ඇතුලත් කරමින් මුල් කොන්ත්‍රාත් වටිනාකමට රු.81,370,000 ක් ඇතුළත් කර රු.152,870,000 ක්වූ කොන්ත්‍රාත් වටිනාකමකට මාස 20 ක කාලයක් තුළ පද්ධතිය සැකසීම සඳහා එම කොන්ත්‍රාත්කාර සමාගම සමඟ 2023 මාර්තු 22 දින මුල් කොන්ත්‍රාත්තුවට අතිරේකයක් අත්සන් කර තිබුණි. | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතන (ICTA) සහ ලෝක බැංකුවේ උපදේශකයන් විසින් ලබාදුන් යෝජනා අනුව තීක්ෂණ සමාගම සමඟ පැවති මුල් කොන්ත්‍රාත්තුව සංශෝධනය කිරීමට සිදුවිය. | කොන්ත්‍රාත් කාලය තුළ ප්‍රමාණවත් කාර්යසාධනයක් නොපෙන්වන කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් අවශය පියවර ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම්වල ප්‍රමාණවත් කොන්දේසි ඇතුළත් කරමින් කොන්ත්‍රාත් ගිවිසුම් පිළියෙල කිරීම හා ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම මත අවශ්‍ය පියවර ගැනීම කළ යුතු වීම. |
| (iii) | 2019 නොවැම්බර් 25 දින පද්ධතිය සංවර්ධනය කිරීමේ මූලික ගිවිසුමට එළඹී තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් මිල සැඳහුම් ක්‍රමය යටතේ පමණක් ලංසු කැඳවීමට පද්ධතිය සංවර්ධනය කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට e-GP පද්ධතියේ ලියාපදිංචි රාජ්‍ය ආයතන 465 ක් වූ අතර, එයින් ආයතන 69 ක් හෙවත් සියයට 15 ක් පමණක් e-GP පද්ධතියේ වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමයේ ක්‍රියාවලියට අවතීර්ණ වී තිබුණි. මුදල් අමාත්‍යාංශය විසින් e-GP පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු අවස්ථා 03 කදී පමණක් වූ අතර, භාණ්ඩාගාරය යටතේ පවතින දෙපාර්තමේන්තු ද මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියට විධිමත්ව අවතීර්ණ වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | දැනට මිල සැඳහුම් ක්‍රමය යටතේ ලංසු කැඳවීමට පද්ධතිය සංවර්ධනය කර ඇති අතර 2024 වර්ෂය තුලදී විවෘත තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රමයට ප්‍රසම්පාදන කටයුතු කිරීමට හැකිවන ලෙස promise.lk සංවර්ධනය කරමින් පවතී. 2024 මැයි 22 දින වන විට e-GP පද්ධතියේ ලියාපදිංචි රාජ්‍ය ආයතන 523 ක් වූ අතර, එයින් ආයතන 152 ක් හෙවත් සියයට 30ක් පමණක් e-GP පද්ධතියේ වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමයේ ක්‍රියාවලියට අවතීර්ණ වී තිබේ. මුදල් අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු 18 ක් මේ වන විට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය යටතේ ලියාපදිංචි වී ඇති අතර, | රාජ්‍ය ආයතන, e-GP පද්ධතියේ වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමයේ ක්‍රියාවලියට අවතීර්ණ කරගත යුතු වීම. රාජ්‍ය ආයතනවල සියලුම ප්‍රසම්පාදනයන් සඳහා e-GP ක්‍රමය ව්‍යාප්ත කිරීම හා දැනට සංවර්ධනය කර ඇති මොඩියුල භාවිතයටත් අවශ්‍ය පියවර ගත යුතු වීම. |

2024 වර්ෂයේ ප්‍රසම්පාදනයන් 28 විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හරහා සිදුකර ඇත.

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වාහන

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශයේ ප්‍රවාහන ඒකකයට වාහන මෙහෙයුම් කටයුතු පහසු කිරීම සඳහා භාවිතා කළ හැකි පරිගණක යෙදවුමක් සකස් කරදී තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම පද්ධතිය භාවිතා කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | පරිගණක යෙදවුම් පද්ධතිය සම්බන්ධව පුහුණුවක් තොරතුරු තාක්ෂණ කළමණාකරණ දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇතත්, එම නිලධාරීන් දැනට ප්‍රවාහන අංශයේ සේවයේ නියුතුව නොමැති බැවින් නව නිලධාරීන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දී ඊළඟ වර්ෂයේ සිට මෙම පරිගණක යෙදවුම් පද්ධතිය නැවත භාවිතා කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සකසා දී ඇති පරිගණක මෙහෙයුම් පද්ධතිය භාවිතයේ යෙදවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2023 වර්ෂයේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගන්නා ලද තොරතුරු අනුව, මුදල් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති වාහන 257 ක් පැවති අතර, එම වාහන සංඛ්‍යාව අතරින් වාහන 176 ක භෞතික පැවැත්ම තහවුරු නොකෙරුණි. ඒ අතුරින් වාහන 99 ක් පිළිබඳ භෞතික පැවැත්ම ඇතුළු තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | දැනට වාහන 176 සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති සියලු වාහන පිළිබඳ භෞතික පැවැත්ම හා අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගණක දත්ත පද්ධතිය තුළ වෙනත් පාර්ශවයන් නමින් ලියාපදිංචි කොට ඇති එකතුව රු.62,639,000 ක වටිනාකමක් සහිතව වාහන 10 ක් අමාත්‍යාංශය සතු වාහන ලෙස අමාත්‍යාංශයෙහි ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණි. | මෙම අමාත්‍යාංශය යටතේ භාවිතට ගනු ලබන වාහන මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | අමාත්‍යාංශය නමින් ලියාපදිංචි නොවූ වාහන ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර ඇති බැවින් ඒ සම්බන්ධ |

| | | | |
|---|---|---|---|
| | | | තොරතුරු විමසා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශය සතු වාහන 44 ක් වෙනත් ආයතන වෙත නිදහස් කර තිබුණ ද, ඒවා විධිමත් පරිදි පවරා දී නොතිබුණු අතර, වෙනත් ආයතන වෙතින් අමාත්‍යාංශය වෙත විධිමත් පවරාගැනීමකින් තොරව වාහන 11 ක් ලබා ගෙන තිබුණි. | දැනට එසේ ලබා දී ඇති වාහන විධිමත් පරිදි පවරා දීමටත්, පවරා ගැනීමටත් කටයුතු කරගෙන යනු ලැබේ. | අමාත්‍යාංශය සතු වාහන වෙනත් ආයතන වෙත පවරා දීම සහ වෙනත් ආයතන වෙතින් පවරා ගැනීම විධිමත්ව සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බදු අභියාචනා කොමිෂන් සභාව වෙත 2011 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් 31 දින දක්වා බදු අභියාචනා 1,706 ක් ලැබී තිබුණි. ඒ පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | 2023 දෙසැම්බර් 31 වන විට බදු අභියාචනා කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති නිශ්චයන් ලබා නොදුන් අභියාචනා 617 ක් තිබූ අතර ඊට අදාළ මතභේදකාරී මුළු බදු මුදලේ වටිනාකම රු. 120,632,702,366 ක් විය. මේ තුළ රුපියල් බිලියනය ඉක්මවන අභියාචනා 34 ක එකතු වටිනාකම රු.69,971,348,414 ක් හෙවත් නිශ්චයන් ලබා නොදුන් මුළු අභියාචනා වටිනාකමින් සියයට 58 ක් ද, රු.මිලියන 100 - 1000 පරාසය තුළ එකතුව රු. 40,264,266,831 ක් වූ අභියාචනා 133 ක් හෙවත් නිශ්චයන් ලබා නොදුන් මුළු අභියාචනා වල වටිනාකමින් සියයට 33 ක් විය. | බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2023 දෙසැම්බර් 31 දක්වා නිශ්චයන් ලබා නොදුන් අභියාචනා 617 ක් ඇති අතර, ඊට අදාල මතභේදකාරී මුළු බදු මුදලේ වටිනාකම රු.120,632,702,366 ලෙස සඳහන් වුවද, අදාල අභියාචනා විමසීමේ ක්‍රියාවලිය තුල දී බදු ගෙවන්නන් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අතර සමතයකට පත් කිරිමට බදු අභියාචනා කොමිෂන් සභාව මැදිහත්වීම මෙන්ම කොමිෂන් සභාව විසින් විනිශ්චයන් ලබාදීමේදී මෙම මතභේදකාරී මුළු බදු මුදලේ වටිනාකම වෙනස්විය හැකි බැවින් නිශ්චිත වශයෙන් අදාල අභියාචනා මත | බදු අභියාචනා සම්බන්ධ පරීක්ෂණ කටයුතු කඩිනම් කර හිඟ බදු මුදල් අයකර ගැනීමට නිසි පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | අයවීමට ඇති මතභේදකාරී බදු මුදල (Disputed Value of Tax) ගණනය කළ හැකි නොවේ. | |
| (ii) | බදු අභියාචනා කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති මුළු අභියාචනා සංඛ්‍යාවෙන් අභියාචනා 1,059 ක් හෙවත් සියයට 62 ක් ආදායම් බදු සම්බන්ධයෙන් විය. එම අභියාචනාවලින් 2023 දෙසැම්බර් 31 දින වන විට විභාග කිරීම ආරම්භ කර ඇති අභියාචනා 455 ක් අතරින් ලියාපදිංචි කර වසර 03 – 12 පරාසය තුළ නිශ්චය ලබා දී නොතිබූ මතභේදකාරී බදු වටිනාකම රු.29,466,916,108 ක් වූ අභියාචනා 183 ක් පැවති බව නිරීක්ෂණය විය. | 2011 අංක 23 දරණ බදු අභියාචනා කොමිෂන් සභා පනතේ සාමාජිකයන් තිදෙනෙකු බැගින් වූ මණ්ඩල තුනක් පවත්වා ගෙන යාමට ප්‍රතිපාදන සලසා තිබුණද 2019 වර්ෂය දක්වාම සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුත් එක් විනිශ්චය සභාවක් වශයෙන් කොමිෂන් සභාව ක්‍රියාත්මක වී ඇති අතර, එකී කාලය තුළද තුන් අවුරුදු කාල සීමාව අවසානයේදී නව සාමාජිකයින් පත් කිරීම නිසි පරිදි සිදුවී නොමැතිවීම හේතුවෙන් අභියාචනා විමසීම් කටයුතුද අඛණ්ඩව සිදු වී නොමැත. එසේම, COVID -19 වසංගතය පැතිරුණු කාලසීමාව තුළද, මෙම කොමිෂන් සභාවේ කටයුතු පවත්වා ගෙන යාමට බාධා පැමිණීම හේතුවෙන් අභියාචනා විසඳීමේ ප්‍රමාදයන් සිදුව ඇත. ජනාධිපතිතුමා විසින් 2022.09.01 දින සිට වත්මන් සාමාජිකයින් නව දෙනා පත් කිරීමත් සමඟ විධිමත්ව අභියාචනා විමසීම් කටයුතු ආරම්භ විය. | -එම- |
| (ආ) | අංක 2187/27 හා 2020 අගෝස්තු 09 දිනැති ගැසට් පත්‍රය මඟින් ඇවර කිරීමට නියමිත වූ වනජීවී භාරය හා ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කර, 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 03 ක් ඉක්මවී තිබුණ ද, මෙම ආයතන දෙක ඇවර කර, නීති ප්‍රකාරව වසා දැමීම සිදු කර නොතිබුණි. | • වනජීවී භාරය ආරම්භයේ සිට වසා දැමීම දක්වා සියලුම වර්ෂයන්ට අදාළ අවසන් ගිණුම් වාර්තා සකස් කර විගණනය කර නොමැත. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති පරිදි ආයතනයේ බැංකු ගිණුම වසා දමා සියලු වත්කම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා දී ඇති බැවින් වසා දැමීමට අවශ්‍ය පියවර ගැනීමට | අදාළ ආයතනවල ඇවර කිරීමේ කටයුතු අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| | අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබාගෙන ඇත. වනජීවී භාරය වසා දැමීමට කටයුතු කළයුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා ගැනීමට නීතිපති වෙත ලිපියක් යොමු කර ඇත.<br><br>• ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනයේ තොරතුරු සොයාගත නොහැක. ජනාධිපති ලේකම් කාර්යාලය, ජනමධ්‍ය අමාත්‍යාංශ සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය එම තොරතුරු ඔවුන් සතුව නොමැති බව දැනුම් දී ඇත. ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් නැවත තොරතුරු විමසා 2024.05.16 දින ලිපියක් යොමු කර ඇති අතර පිළිතුරක් මේ වන විට ලැබී නොමැත. | |
| (ඇ) අමාත්‍යාංශයේ නිල නිවාස 12 ක් පිළිබඳව සමාලෝචිත වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂාවට අදාළ නිරීක්ෂණයන් පහත දැක්වේ. | | |
| (i) අමාත්‍යාංශය විසින් නිල නිවාස ලබා දීමේදී නිලධාරින් සමග ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව නිලධාරින් 05 දෙනෙකු සඳහා වසර 05 ක කාල සීමාවක් සඳහාත්, නිලධාරින් 05 ක් සඳහා අමාත්‍යාංශයේ සේවය කරන තාක්කල් හෝ අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරන අයුරින් යම්කිසි කාලපරිච්ඡේදයක් සඳහා යනුවෙන් සඳහන් කර ලබා දී තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ නිලධාරින් වෙත නිල නිවාස ලබාදීමේ කාල සීමාව තීරණය කිරීම සම්බන්ධයෙන් ඒකාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | - | නිල නිවාස ලබා දීමේ කාලසීමාව සම්බන්ධයෙන් ඒකාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | අමාත්‍යාංශය විසින් නිලධාරීන් 04දෙනෙකු සඳහා ලබා දී තිබූ නිල නිවාස ගිවිසුම්වල සඳහන් කාලසීමාව ඉකුත් වී තිබූ අතර, 2024 මැයි 22 දින වන විටත් අදාළ නිල නිවාස අමාත්‍යාංශය වෙත ආපසු ලබාගැනීමට හෝ කාලය දීර්ඝ කර නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම නිලධාරීන් හට නිල නිවාස භාර දීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශය විසින් ලිඛිතව 2024 මාර්තු මාසයේදී දන්වා ඇත. තව දුරටත් 2024.05.31 දින වන විටත් නිල නිවාස භාර නොදුන්නොත් 2024 මාර්තු මස සිට ආයතන සංග්‍රහය පරිදි 8% ක දඩ මුදලත් 12.5% ක නිවාස කුලී සහ ආර්ථික කුලී අය කර ගන්නා බවට දැනුම් දී ඇත. | නිල නිවාස ලබා දී තිබූ කාලය ඉකුත් වූ විට නැවත නිල නිවාස ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | නිල නිවාස ආපසු භාරදීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශය විසින් ලිඛිතව දන්වා තිබුණ නිලධාරීන් දෙදෙනෙකු විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින වන විටත් අදාළ නිල නිවාස භාරදීමට හෝ ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට පියවර ගෙන නොතිබුණි. ආයතන සංග්‍රහයේ XIX පරිච්චේදයේ 07 වගන්තිය අනුව නිවාසයෙන් අස්වී යන ලෙස නිලධරයෙකුට නියම කළ විට ඔහු එසේ නොකළහොත්, 1971 අංක 3 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරණ රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ ඔහු එම නිවාසයෙන් ඉවත් කිරීමටත්, බදු කාලය ඉක්මවා නිවාසයක පදිංචිව සිටින කාලය වෙනුවෙන් දණ්ඩන කුලියක්ද ඔහුගෙන් අයකරගත යුතු බව දක්වා තිබුණු නමුත් වසර 07ක පමණ සිට නිල නිවාස ආපසු භාර දී නොමැති නිලධාරිනියන් දෙදෙනා සඳහා අමාත්‍යාංශය විසින් 2023 නොවැම්බර් 30 දින වන විටත් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම නිලධාරීන් හට නිල නිවාස භාර දීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශය විසින් ලිඛිතව 2024 මාර්තු මාසයේදී දන්වා ඇත. තව දුරටත් 2024.05.31 දින වන විටත් නිල නිවාස භාර නොදුන්නොත් 2024 මාර්තු මස සිට ආයතන සංග්‍රහය පරිදි 8% ක දඩ මුදලත් 12.5% ක නිවාස කුලී සහ ආර්ථික කුලී අය කර ගන්නා බවට දැනුම් දී ඇත. | නිල නිවාස භාර දීමට අපොහොසත් වන නිලධාරීන් පිළිබඳව ආයතන සංග්‍රහයේ XIX පරිච්චේදයේ 07 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iv) | අමාත්‍යාංශය සතු නිල නිවාසයක් 2016 වර්ෂයේදී නිලධාරියෙකු වෙත ලබා දී තිබූ අතර, එම නිල නිවාසයට අදාළ මුල් ලිපිගොනුව අස්ථානගත වී තිබුණි. | මුල් ලිපිගොනුව අස්ථානගත වී ඇති බැවින් වර්තමානයේ ඇති ලිපිගොනු අනුව කටයුතු කරමින් පවතී. | ලිපිගොනු පවත්වාගෙන යනු ලබන විෂය භාර නිලධාරීන් වෙත අදාළ ලිපිගොනු සුරක්ෂිතව පවත්වා ගැනීමේ වගකීම පැවරීම හා අස්ථානගත වූ ලිපිගොනුව සොයා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශයේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 103 ක් වී තිබුණි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 18 ක් ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 57 ක් ද විය. | වාර්ෂික ස්ථාන මාරු, වාර්ෂික නොවන ස්ථාන මාරු, යටතේ අනුයුක්ත කිරීම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කරන නව බඳවා ගැනීම් යටතේ අනුයුක්ත කරන නිලධාරීන් හා සේවා අවශ්‍යතාව මත අමාත්‍ය මණ්ඩලය විසින් සිදුකරන අනුයුක්ත කිරීම් මඟින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සිදු කරන අතර, පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ පත්කිරීම් බලධාරීන් දැනුවත් කර ඇත. මීට අමතරව මෙම තනතුරු සඳහා අමාත්‍යාංශය මඟින් නිලධාරීන් බඳවා ගැනීම සිදු නොවේ. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීම හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතු විම. |
| (ආ) | වෙනත් ආයතනවල සේවය සඳහා නිදහස් කරන ලද නිලධාරීන් 15 දෙනෙකු සඳහා 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.8,086,967 ක් ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩලය විසින්, අදාළ පත්කිරීම් බලධාරීන් විසින් සේවා අවශ්‍යතාවය මත, සහ නිලධාරීන්ගේ පෞද්ගලික ඉල්ලීම් සාධාරණීකරණය කිරීමෙන් අනතුරුව නිශ්චිත කාල සීමා සඳහා වෙනත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සඳහා නිලධාරීන් මුදා හැර ඇත. | සේවය කරන ලද ආයතනවලින් වැටුප් හා දීමනා ලබා ගැනීමට හැකිවන පරිදි විධිමත් ලෙස මුදාහැරීමට කටයුතු කළ යුතු වීම. |